# 1.39 සමකාලීන ශ්‍රී ලාංකේය නිර්මාණ සංගීතයේ දැකිය හැකි භාරතීය රස-භාවෝත්පාදක ක්‍රමවේද

ජී.ඩී.සුජිත් ප්‍රියදර්ශන
දෘශ්‍ය කලා සැළසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

භාරතීය සංගීතය ප්‍රධාන වශයෙන්ම ස්වර, පද තුලින් රස භාව නිෂ්පත්තිය කිරීම අරමුණ කරගත් විශ්ව ව්‍යාප්ත සංගීත ක්‍රමයකි. රස භාවයන් ව්‍යුත්පන්න කිරීමේ දී ස්වර, පද සහ තාල යන ත්‍රිවිධ කරුණු සඳහා විශේෂ අවධානයක් මෙහි දී යොමු වේ. රාග ආශ්‍රිත කරගත් ගීත ශෛලීන්ගේ විවිධ යොදා ගැනීම් වල දී පුද්ගලයාට අනුකලූව සහ අවස්ථාවන්ට අනුව භාවෝද්දීපනය වන ආකාරයට ස්වර සංගතීන් වෙනස් කර ගායනය හෝ වාදනය කිරීමේ හැකියාව භාරතීය සංගීතයේ ඇත. මේ ස්භාවය නිසා රස-භාවෝද්දීපනයේ දී භාරතීය සංගීතය උච්ච ස්ථානයක ඇත. ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතය, චිත්‍රපට සංගීතය සහ ජන සංගීතය යන ක්ෂේත්‍ර මෙම රස භාව පිළිබඳ අධ්‍යනයේ දී අවධානයට ලක් වේ.

භාරතයට ආසන්න සමාන්තරගත සංස්කෘතික උරුමයන් ශ්‍රී ලංකාව ද සතුය. ලෞකික හා ආධ්‍යාත්මික වශයෙන් ඇති වන ආකල්ප , සිතුම් පැතුම් සහ භෞතික සාධක නිසා මෙම දේශයන් දෙකේ හී ඇති වන සෞන්දර්යයාත්මක හැඟීම් වල විශාල වශයෙන් වෙනසක් දැකිය නොහැක.

නූතන ශ්‍රී ලාංකීය සංගීත ක්ෂේත්‍රයේ ඇති වන නිර්මාණ බොහෝ විට එළි දකිනුයේ චිත්‍රපට සංගීතය සහ ගීත/වාද්‍ය සංයුක්ත තැටි මගිනි. සංගීතය වැනි ප්‍රාසංගික විෂයක සෞන්දර්යයාත්මක බව දෙ ආකාරව පිළිබිඹු වේ. එනම් ප්‍රේක්ෂකයා විසින් දකින සෞන්දර්යය සහ නිර්මාණකරුවා විසින් පිළිබිඹු කරන සෞන්දර්යයයි. ප්‍රේක්ෂකයා යම් සෞන්දර්යාත්මක බවක් රස විඳිනුයේ නිර්මාණකරුවා උකහා පෙන්වන රස-භාවයන්ගෙනි. මෙම රස-භාව උද්දීපනය ශ්‍රී ලාංකීය සංගීත නිර්මාණ වල දැකිය හැකි ද යන්න සොයා බැලීම උචිත කරුණකි.

ශ්‍රී ලාංකීය සංගීත ක්ෂේත්‍රයේ නූතන යුගයේ නිර්මාණකරුවන් අතර ඇතැමෙක් ප්‍රවීණයෝ වෙති. ඇතැමෙක් යොවුන් පරපුරේ නිර්මාණ කරුවන් ය. මොවුන්ගේ සංගීත නිර්මාණවල භාරතීය සංගීතයේ එන රස-භාව ප්‍රකාශන ක්‍රියාවලීන් උද්දීපනය වන්නේ ද එසේත් නැතිනම් රස-භාව නිෂ්පත්තිය කෙරෙහි භාරතීය චිත්‍රපටයන්ගේ විවිධ සන්සිද්ධීන්ට අදාල භාවෝද්දීපන සංගීත ඛණ්ඩ හෝ ගීත අවස්ථාවන් යොදා ගැනීම් හෝ අනුකරණයක් සිදු වී ඇත් ද යන්න සහ ජන සංගීතයේ එන ස්වදේශීය අනන්‍යතාවන් පිළිබිඹු කරන විවිධ ජනශ්‍රැතීන් ගේ ආභාසය ලැබාගෙන ඇත් ද යන්න අධ්‍යයනය කිරීම යෝග්‍ය වේ.